# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,879/7 — 1969 නොවැම්බර් 18 වැනි අඟහරුවාද — 1969.11.18

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ජේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### ලංකා රජයේ උගස් බැංකුව

**පැවරීමේ ආඥාව (අංක 5)**

1968 අංක 33 දරණ රජයේ උගස් බැංකු හා මුදල් (සංශෝධන) පනතින් සංශෝධිත ලංකා රජයේ උගස් බැංකු ආඥාපනතේ 70 බී (6) දරණ වගන්තිය යටතේ මෙහි උපලේඛනයේ සම්පූර්ණයෙන් විස්තර කර ඇති දේපල ඉහත කී 1968 අංක 33 දරණ පනතින් සංශෝධිත ඉහත කී ආඥාපනතේ V ඒ පරිච්ඡේදයේ අභිප්‍රායයන් උදෙසා පවරා ගත යුතු බවට 1931 අංක 16 දරණ ආඥාපනතේ (1956 ව්‍යවස්ථාපිත අණපනත්හි 398 පරිච්ඡේදය) විධිවිධානයන් යටතේ විධි වූ පරිදි සංස්ථාපිත ඒකාබද්ධ මණ්ඩලයක් වන ලංකා රජයේ උගස් බැංකුව විධි වූ පරිදි නිශ්චය කර ඇති හෙයින් ද,

ඉහත කී ආඥාපනතේ 70 සී (1) දරණ වගන්තියේ විධිවිධානයන්ට අනුකූලව ඉහත කී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිතුමා විසින් එකී නිශ්චය කිරීම මුදල් ඇමතිවරයා වෙත දන්වනු ලැබී ඇති හෙයින් ද,

ඉහත කී ආඥාපනතේ 70 සී (2) දරණ වගන්තියේ විධිවිධානයන් යටතේ මෙහි උපලේඛනයේ සම්පූර්ණයෙන් විස්තර කර ඇති දේපල ලංකා රජයේ උගස් බැංකුව වෙත පවරා දීමට මුදල් ඇමතිවරයාට බලතල ඇති හෙයින් ද,

මෙහි පහත උපලේඛනයෙහි සම්පූර්ණයෙන් විස්තර කර ඇති දේපල 1969 නොවැම්බර් මස 12 වෙනි දින සිට ලංකා රජයේ උගස් බැංකුව කෙරෙහි පවරමින් මුදල් ඇමති උක්කු බණ්ඩා වන්නිනායක වන මම මෙයින් අණ කරමි.

යූ. බී. වන්නිනායක,
මුදල් ඇමති.

1969 නොවැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

### ඉහත සඳහන් උපලේඛනය

1. මඩකලපු ඉඩම් ලියාපදිංචි කිරීමේ (දැන් අම්පාරේ) කාර්යාලයේ ඊ. 19/86 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති නැගෙනහිර පළාතේ, අම්පාරේ දිස්ත්‍රික්කයේ (පෙර මඩකලපුව) නින්තවූර් පත්තුවේ, නින්තවූර් හි 4 වෙනි කොට්ඨාශයේ පිහිටි, අංක 9676 දරණ බිම් කට්ටියේ ගිනිකොන දෙසින් පිහිටි කොටස වන පලයියාඩිවල වූ හි බස්නාහිර කොටස නැමති උතුරට ඒ. සෙයිනපුළුම්මාට අයිති මෙම ඉඩමේ අනෙක් කොටස ද, දකුණට කුඩා පාර ද, නැගෙනහිරට ඒ. පාතුම්මාට අයිති මෙම ඉඩමේ අනෙක් කොටස ද, බස්නාහිරට ඒ. සුලයිකළුම්මාට අයිති ඉඩම ද යන මෙකී මායිම් තුළ, උතුරේ සිට දකුණට බඹ දහතුනක් ද (බ. 13), නැගෙනහිර සිට බස්නාහිරට බඹ දහතුනහමාරක් ද (බ. 13½) විශාල ඉඩම එහි පිහිටි ගහකොළ, වැව්ලි, ගොඩනැගිලි ඇතුළු සියළු දේත් සමග.

ඉහත කී ඉඩම දැනට පර්චස් විස්සකුත් දෙකෙන් පංගුවකැයි (අ. 0–රූ. 0 ප. 20½) අවසරලත් මිනින්දෝරු එච්. ජේ. ජේ. එස්තාගොපිල්ලෙයි මහතා විසින් 1968 අප්‍රේල් මස 18 වෙනි දින සාදන ලද අංක 18 දරණ මිනුම් සැලැස් මෙහි පෙන්නුම් කර ඇත.

(ලිපි ගොනු අංකය : ටීඩීආර්/49.)

2. ත්‍රිකුණාමලය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ. 25/53 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමල නගරයේ අංක 9 දරණ කොට්ඨාශයේ, ත්‍රිකුණාමල නගරයේ වරිපනම් අංක 13 දරණ ඊසාන දෙසට පාර ද, වයඹ දෙසට කනපති මුරුගුපිල්ලේගේ උරුමක්කාරයින්ට අයිති ඉඩම ද, නිරිත දෙසට ෂන්මුගම්ගේ වැන්දඹුව වන වේලාත්තෙයිට අයිති ඉඩම ද, ගිණිකොන දෙසට එස්. වේලුපිල්ලේගේ උරුමක්කාරයින්ට අයිති ඉඩම ද යන මෙකී මායිම් තුළ, අවසරලත් මිනින්දෝරු ටී. සුබ්‍රාමනියර් මහතා විසින් 1934 මාර්තු 12 වෙනි දින සාදන ලද අංක 80 දරණ මිනුම් සැලැස්මට අනුව පර්චස් අටකුත් දහයෙන් අටක් (අ. 0 රූ. 0 ප. 8 8/10) විශාල ඉඩම එහි පිහිටි ගහකොල, වැව්ලි සහ පරණ ගෙය ද ඇතුළු සියළු දේත් සමග.

(ලිපි ගොනු අංකය : ටීඩීආර්/74.)

3. ජේදුරුතුඩුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ. 95/21 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති උතුර පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වඩමරච්චි කොට්ඨාශයේ, උඩුපිඩි මීසමේ, උඩුපිඩි ඉරයි ගමෙහි පිහිටි නවලඩියිට් කලඩ්ඩි, මරුතන්කුලි, අඩිච්චිප්පලම් සහ වයිකාල් මනල් නැමති නැගෙනහිරට සුසාන භූමිය හා වලව්දර් මුත්තයියාගේ හිමිකරුවන්ට සහ අනිකුත් අයට අයිති ඉඩම ද, උතුරට මුහුදු වෙරළ ද, බස්නාහිරට විනයාගසුන්දරම්ගේ දියණිය වූ චන්ද්‍රකාන්තිගේ ඉඩම වූ දැනට තන්ගවඩිවේල් තිරුනවුක්කරසු සහ බිරිඳ වූ සන්තිරනායකිගේ ඉඩම ද, දකුණට පාර ද යන මෙකී මායිම් තුළ ව. ස. ලාවම්ස් දහයයි කුලිස් තුනකුත් දොළහෙන් එකොළහක් (වී. සී. ලා. 10කු. 3 11/12) ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබෙල්ල සහ එහි පිහිටි ගහකොළ, වැව්ලි, ගොඩනැගිලි ඇතුලු සියලු දේත් සමග.

ඉහත කී ඉඩම දැනට වී. සී. ලාවම්ස් දහයකැයි (වී. සී. ලා. 10) අවසරලත් මිනින්දෝරු පී. අරම්පු මහතා විසින් 1966 අප්‍රේල් මස 1 වෙනි දින සාදන ලද අංක 224 දරණ මිනුම් සැලැස්මේ පෙන්නුම් කර දී ඇත.

(ලිපි ගොනු අංකය : ටීඩීආර්/92.)

4. යාපනය දිස්ත්‍රික්කයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච්. 304/212 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති උතුර පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, උතුරු වලිකාම්ම කොට්ඨාශයේ, මයිලිඩ්ඩි මීසමේ, මයිලිඩ්ඩි (මිනුම් සැලැස්මට අනුව පෙරියනද්දන්තෙරන්තුරෙයි) හි පිහිටි නැගෙනහිරට අතුරු මාර්ගයෙන් ද, උතුරට මුහුදු වෙරලෙන් ද, බස්නාහිරට මුත්තම්බි නල්ලතම්පිට අයිතිව තිබූ දැනට නල්ලතම්බිගේ භාර්‍යාව වන පොන්නම්මාට අයිති ඉඩමෙන් ද, දකුණට සෝමසුන්දරම්ගේ වැන්දඹුව වන නාගපිල්ලේට අයිති ඉඩමෙන් ද මායිම් වූ වී. සී. ලාවම්ස් දෙකක් සහ කුලිස් තුනක ප්‍රමාණයෙන් අලඩියිට්කඩු (මිනුම් සැලැස්ම අනුව අලඩිකඩු) නැමති ඉඩම, ගහකොල සහ අනිකුත් සියළු දේත් බලයලත් මිනින්දෝරු ආර්. සී. ලෝරන්ස් පිල්ලේ මහතා විසින් සාදන ලද අංක 430 සහ 1966.6.14 දින දරණ මිනුම් සැලැස්ම අනුව යථෝක්ත ඉඩම වී. සී. ලාවම් එකයි කුලී දහතර (වී. සී. ලා. 1 කු. 14) ක ප්‍රමාණයෙන් යුක්ත ය.

(ලිපි ගොනු අංකය : ටීඩීආර්/119.)

5. පේද්‍රුරුතුඩුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ. 133/117 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති, උතුර පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වඩමරච්චි කොට්ඨාශයේ, කඩ්ඩායිවේලි මීසමේ, කරවෙඩ්ඩි වෙන්රිකුරිච් නම් ගමේ පිහිටි නාවල්නින්රොල්ලායි නැමති නැගෙනහිරට කාන්දන් වල්ලිගේ ඉඩමෙන් ද, උතුරට චින්නපොඩියන් තම්පන් හා බිරිඳ වූ චින්නම්මාගේ ඉඩම ද, බස්නාහිරට කනපතිගේ වැන්දඹුව වූ වයිරාචිගේ හා අනිකුත් අයගේ ඉඩමෙන් ද, දකුණට පටුමග යන මෙකී මායිම් තුළ පිහිටා ඇති, වී. සී. ලාවම්ස් තුනක් හා කුලිස් දෙලහක් (වී.සී.ලා. 3 කු. 12) ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ල හා එහි පිහිටි ගහ කොළ වැවිලි හා ගොඩනැගිලි ඇතුලු සියලු දේත් සමග.

ඉහත කී ඉඩම දැනට වී. සී. ලාවම්ස් තුනක් හා කුලිස් දෙකක් (වී.සි.ලා. 3 කු. 2) යැයි වී. සිවරත්නම් අවසරලත් මිනින්දෝරු මහතා විසින් 1967 නොවැම්බර් 22 දින සාදන ලද අංක 2683 දරණ මිනුම් සැලැස්මේ පෙන්වා දී ඇත.

(ලිපි ගොනු අංකය : ටීඩීආර්/171.)

6. පේද්‍රුරුතුඩුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ. 54/119 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වඩමරච්චි කොට්ඨාශයේ, පේද්‍රුරුතුඩුව මීසමේ, සින්කපා ගුතවන්කුරිච් අයිරායි බස්නාහිර පුලෝලි හි පිහිටි නැගෙනහිරට පාරෙන් ද, උතුරට දැනට පහත කියැවෙන පිඹුරේ අංක 1 දරණ කට්ටිය යනුවෙන් සඳහන් කර ඇති කනපතිපිල්ලේගේ භායඅාව වන කදිරාත්තිට අයිති ඉඩමෙන් ද, බස්නාහිරට වේලප්පර් තම්බිමුත්තුගේ භායඅාව වන රත්නම්ගේ ඉඩමෙන් ද, දැනට වල්ලියාර් කනපතියාර් සහ තවත් අයගේ ඉඩමෙන් ද, දකුණට දැනට පහත කියැවෙන පිඹුරේ අංක 3 දරණ කට්ටිය යනුවෙන් සඳහන් කර ඇති මුරුගප්පා පෙරියතම්බි සහ තවත් අයගේ ඉඩමෙන් ද මායිම් වූ වී. සී. ලාවම්ස් එකයි කුලිස් නමයයි අටෙන් පහක (වී.සී.ලා. 1 කු. 9 5/8) ප්‍රමාණයෙන් යුත් ජී. සී. ගනපතිපිල්ලේ බලයලත් මිනින්දෝරුතැන විසින් සාදන ලද 1913.8.7 දින අංක 2667 දරණ පිඹුරේ අංක 2 යනුවෙන් ලකුණු කර ඇති වල්ලපෙරුමාල් මරයික්කේ නැමති ඉඩමේ කොටස එහි පිහිටි ගහකොල සහ සියලු දේත් සමග.

(ලිපි ගොනු අංකය : ටීඩීආර්/172.)

7. යාපනය දිස්ත්‍රික්කයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එච්. 377/108 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කරන ලද උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමම් හි උතුරු කොටසේ, මල්ලාකම් හි, අලවෙඩ්ඩි හි පිහිටි වී. සී. ලාවම්ස් දහයයි, කුලී දහයකුත් දහයෙන් නවයක වී.සී.ලා. 10 කු. 10 9/10) ප්‍රමාණයෙන් යුත් නැගෙනහිරට සින්නප්පු පොන්නයියාගේ බිරිඳ වන සරස්වතී දේවිගේ ඉඩම ද, උතුරට වයරමුත්තු පොන්නදුරෙයි සහ කොටස්කරුවන්ට අයත් පොදු පාරක් සඳහා වූ ඉඩම ද, බස්නාහිරට පටුමග ද, දකුණට පටුමග සහ කාර්ති වල්ලිපුරම් සහ තවත් අයට අයිති ඉඩම ද මායිම් වූ කලෙයියවුඩෙයි නම් වූ ඉඩම, ගහකොල, ගොඩ නැගිලි සහ එහි පිහිටි සියළු දේත් සමග.

එකී ඉඩම දැනට වී. සි. ලාවම්ස් දහයයි කුලී දහසය හමාරකැයි (වී.සී.ලා. 10 කු. 16½) අවසරලත් මිනින්දෝරු ටී. කන්දයියා විසින් 1967 සැප්තැම්බර් 1 දින සාදන ලද අංක 3284 දරණ සැලැස්මේ පෙන්නුම් කර ඇත.

(ලිපි ගොනු අංකය : ටීඩීආර්/181.)

8. යාපනය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඞී. 282/248 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ සහ කොට්ඨාශයේ, චුන්ඩිකුලි මීසමේ, චුන්ඩිකුලි හි පිහිටි පෙරියවලවු නැමති උතුරට අන්තෝනිපිල්ලේ වයිතියම්පිල්ලේගේ උරුමක්කාරයින්ට අයිති ඉඩම ද, නැගෙනහිරට එලියතම්බිගේ වැන්දඹුව වන අන්නාපිල්ලේගේ උරුමක්කාරයින්ට අයිති ඉඩම ද, බස්නාහිරට සිවගුරුගේ වැන්දඹුව වන පොන්නම්මාගේ උරුමක්කාරයින්ට අයිති ඉඩම ද, දකුණට කනගරත්නම් රාජරත්නම්ට අයිති ඉඩම සහ ' විදන්ස් ලේන් ' නැමති පටුමගට ඔබ්බෙන් ඇති අතුරු පටුමග ද යන මෙකී මායිම් තුළ දැනට අංක 2 දරණ බිම් කට්ටිය යනුවෙන් ලකුණු කර ඇති වී. සී. ලාවම්ස් එකයි කුලී දහතක් (වී.සී.ලා. 1 කු. 17) විශාල ඉඩම් කැබැල්ල එහි පිහිටි ගහකොල, වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දේත් සමග.

අවසරලත් මිනින්දෝරු පී. ඒ. සේනාදිරාජා මහතා විසින් 1968 මැයි 17 වෙනි දින සාදන ලද අංක 312 දරණ මිනුම් සැලැස්මේ එකී ඉඩම අංක 1 දරණ බිම් කට්ටිය යනුවෙන් පෙන්නුම් කර ඇත.

(ලිපි ගොනු අංකය : ටීඩීආර්/194.)

9. (අ) යාපනය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එච්. 339/175 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, උතුරු වලිකාමම් කොට්ඨාශයේ, උඩුවිල් මීසමේ, චුන්නාකම් හි නගර සීමාව තුළ පිහිටි චුන්නකම් හි අංක 7 දරණ කොට්ඨාශයේ, එලාකම් තෝට්ටම් වීදියේ, වරිපනම් අංක 73 දරණ නීලිවීමා සහ ඌමන්වීමා (සැලැස්මට අනුව නීලිසීමාවුම් සහ ඌමාසීමාවුම්) නැමති නැගෙනහිරට සුප්පයියාගේ බිරිඳ වෙල්ලාම්මාට, දැනට එම්. තම්බිරාජාට හා එම්. නාගරාජට අයිති ඉඩම ද, උතුරට ටී. සී. පටුමගින් ද, බටහිරට කනපති පිල්ලේගේ බිරිඳ වූ කනගම්මා සහ අනිකුත් අයට අයිති ඉඩම ද, දකුණට කන්දයියාගේ බිරිඳ වූ සීන්නතංගම් දැනට කන්දයියාගේ වැන්දඹුව වූ නාගම්මාට අයිති ඉඩම ද යන මෙකී මායිම් තුළ පිහිටී වී. සී. ලාවම්ස් හයක (වී.සී.ලා. 6) ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබෙල්ල හා එහි පිහිටී ගහකොල, වැවිලි, ගොඩනැගිලි ඇතුලු සියලු දේත් සමග.

ඉහත කී ඉඩම දැන් අංක 1 දරණ බිම් කට්ටිය වශයෙන් ද, ප්‍රමාණයෙන් වී. සී. ලාවම්ස් හයක් හා කුලිස් පහලොවක් හා දශම හතක් (වී.සී.ලා. 6 කු. 15.7) යැයි ද, සෙන්යර් සුබ්‍රමානියම් අවසරලත් මිනින්දෝරු මහතා විසින් 1968 ජූනි 5 දින සාදන ලද අංක 436 දරණ මිනුම් සැලැස්මේ පෙන්වා දී ඇත.

(ආ) යාපනය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, අංක එච්. 339/176 දරණ පත්ඉරුවේ ලියා පදිංචි කර ඇති ඉහත කී චුන්නාකම්හි පිහිටා ඇති වීරිමන්සීමා හා වතනා යි නැමති නැගෙනහිරට සීනිගේ බිරිඳ එලායියා පිල්ලේගේ ඉඩම ද, දැනට පටුමග ද, උතුරට ඉහත කී එලායියාපිල්ලේට අයත් දැනට පොන්නුදුරේගේ බිරිඳ චින්තාමනීට අයත් ඉඩම ද, බටහිරට සබාපති තම්බයියා හා බිරිඳ රත්නම්ගේ ඉඩම ද, දකුණට ටී. සී. පටුමග ද යන මෙකී මායිම් තුළ පිහිටි වී. සි. ලාවම්ස් දෙකක (වී.සී.ලා. 2) ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබෙල්ල හා එහි පිහිටි ගහකොල, වැවිලි, ගොඩනැගිලි හා ඉඩමේ උතුරු මායිමට අයත් ඉඩමේ ළිඳෙන් භාගයක් ද (½ කොටස) සමග.

ඉහත කී ඉඩම දැනට වී. සී. ලාවම්ස් එකක් හා කුලිස් දහතරයි දශම දෙකක් (වී. සී. ලා. 1 කු. 14.2) යැයි සෙන්යර් සුබ්‍රමානියම් අවසරලත් මිනින්දෝරු මහතා විසින් 1968 නොවැම්බර් 3 දින සාදන ලද අංක 473 දරණ සැලැස්මේ එම ඉඩම අංක 1 දරණ බිම් කට්ටීය වශයෙන් පෙන්වා දෙමින් සඳහන් කර ඇත.

(ලිපි ගොනු අංකය : ටීඩීආර්/200.)

10. පේද්‍රුරුතුඩුව දිස්ත්‍රික්ක ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ ඒ. 47/174 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වඩමරච්චි කො.ට්ඨාශයේ, උඩුපිඩි මීසමේ, වැල්වෙට්තුරේ නගර සිමාව තුළ පිහිටි ආනයිවිලුන්තන් නොහොත් ආනවුලුන්දන් නැමති නැගෙනහිරට වරවනමුත්තු වෝමවුන්දරම්ගේ හිමිකරුවන්ගේ ඉඩම ද, උතුරට චිවලිංගම්ගේ භායඅාව වූ අරුන්දතී දැනට සිවලිංගම් අරුන්දතීගේ ඉඩම ද, බස්නාහිරට විසුවලිංගම්ගේ බිරිඳ වූ තංගම්මා දැනට ශ්‍රී ස්කන්ධරාජා කන්මනීගේ ඉඩම ද, දකුණට ටී. සී. පටුමග ද යන මෙකී මායිම් තුළ කුලිස් දහයක් (කු. 10) ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබෙල්ල සහ එහි පිහිටි ගහ කොල, වැවිලි, ගොඩනැගිලි ඇතුලු සියලු දේත් සමග.

ඉහත කී ඉඩම දැනට කුලිස් හතකුත් තිස් දෙකෙන් හතරක් (ලැ. 0 කු. 7 4/32) ක් යැයි, අවසරලත් මිනින්දෝරු එස්. පි. කුලන්දයිවේලුපිල්ලේ මහතා විසින් 1968 ජූලි මස 28 වෙනි දින සාදන ලද අංක 1 දරණ මිනුම් සැලැස්මේ පෙන්නුම් කර දී ඇත.

(ලිපි ගොනු අංකය : ටීඩීආර්/203.)

11. ගාලු ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඞී. 507/290 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, හතුවාපියදිගම පිහිටි කහටගහවත්තට මායිම් : උතුරට කජුගහ වත්ත සහ උපාසකරාලගේ හේන ද, නැගෙනහිරට හිග්ගහකොරටුවේ වත්ත ද, දකුණට මූනමල්ගහවත්ත ද, බස්නාහිරට නුගගහවත්ත හා තල්ගහවත්ත ද යන මෙහි තුළ අක්කර එකකුත් රූඩ් දෙකක් (අ. 1 රූ. 2 ප. 0) පමණ විශාල ඉඩමේ තුන්වෙනි වැවිල්ලේ පොල් ගස් අටෙනුත් රටදෙල් ගස් නවයෙනුත් පුවක් ගස් විස්සෙනුත් නොබෙදූ වැවිලි මහන්සි දෙකෙන් පංගුවෙන් තුනෙන් එක පංගුවෙන් ද බිමෙන් සහ ඉතිරි ප්‍රවේනියේ ගහ කොල පලතුරුවලිනුත් නොබෙදූ පහලොවෙන් හතර පංගුවෙන් ද නොබෙදූ දෙකෙන් පංගුව ද එහි තිබෙන අතුසෙවිලි පස් රියන් ගෙය ද වේ.

ඉහත කී නොබෙදූ කොටස්, දැනට අවසරලත් මිනින්දෝරු පි. ජේ. නානායක්කාර මහතා විසින් සාදන ලද අංක 582 දරණ මිනුම් සැලැස්මෙහි අංක 2 දරණ බිම් කට්ටිය යනුවෙන් පෙන්නුම් කර තිබේ.

(ලිපි ගොනු අංකය : ටීඩීආර්/246.)

12. මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ. 392/204 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කරන ලද මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර, උඩගම්පහ කෝරලේ, සිරිමල්වත්තේ පිහිටි උතුරට ඩිංගිරි මැණිකාට අයත් ඉඩමේ සීමාව ද, නැගෙනහිරට අඹගහගෙදරවත්ත ද, දකුණට හෙට්ටිගෙදරවත්ත ද, බස්නාහිරට ගලහිටියාවේ බණ්ඩාර මැණිකාට අයිති ඉඩම ද මායිම් වූ හෙම්බාදෙනියේ ගෙදරවත්ත නැමති ඉඩමේ දෙපෑල පල්ලාහක පමණ වපසරිය ඇති නොබෙදූ දෙකෙන් පංගුව එහි පිහිටි ගහකොල, ගොඩනැගිලි ඇතුලු සියලු දේත් සමග.

එකී ඉඩම ඒ. බී. fපයර්ස් මිනුම්පති විසින් 1875 අගෝස්තු 28 වෙනි දින සහතික කරන ලද ටී. පී. 100985 දරණ මිනුම් සැලැස්ම හා සැසඳේ.

(ලිපි ගොනු අංකය : පීඩීආර්/305.)

13. කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී. 1—14/3555 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මුදලිතුමාගේ කොට්ඨාශයේ, අඹතලෙන් පහල ගොතටුවේ පිහිටි උතුරට ආණ්ඩුවේ දෙවට පාරෙන් ද, නැගෙනහිරට යාලගේ දෙන් දවිත් අප්පුට අයිති මෙම ඉඩමේ කොටසින් ද, දකුණට නවගමුවගේ ඩැනියෙල් පෙරේරාට අයිති මෙම ඉඩමේ කොටසින් ද, බස්නාහිරට හෙට්ටිගේ දෙන් කරෝලිස් මිල දී ගත් කොටසින් ද මායිම් වූ වී බුසල් එකක පමණ වපසරිය ඇති තලගහවත්ත නැමති ඉඩමේ නොබෙදූ විසිහතරෙන් දහතර පංගුව (14/24) සහ එහි පිහිටි අත්තිවාරම ළිඳ සහ වැසිකිලිය සමග.

ඉහත කී නොබෙදූ විසිහතරෙන් දහතර පංගුව (14/24) එන්. ඩී. සිරිසේන බලයලත් මිනින්දෝරුතැන විසින් 1966 මාර්තු මස 6 වෙනි දින සාදන ලද අංක 803 දරණ පිඹුරේ පර්චස් පහලොවයි දශම දෙකක (අ.0 රූ.0 ප. 15.2) ප්‍රමාණයෙන් යුත් ' බී ' අක්ෂරය දරණ කට්ටිය යනුවෙන් දැන් හඳුන්වා ඇත.

(ලිපි ගොනු අංකය : ටීඩීආර්/419.)

14. කොළඹ දිස්ත්‍රික්කයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච්. 183/176 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති, බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, මැද පත්තුවේ, ජල්තර පිහිටි ඩී.පී.ඒ. ජයසිංහ අවසරලත් මිනින්දෝරු මහතා විසින් 1955 ඔක්තෝබර් 9 වෙනි දින මැන සාදන ලද අංක 596 දරණ ප්ලෑනේ ප්‍රකාර, වනුමුරේඹිවිට සහ වනුරේඹිවිටෙ කැබැල්ල නම් ඉඩමේ අංක 1 දරණ කොටස කියන උතුරට පොදු වැඩ දෙපාර්තමේන්තුවේ පාර ද, නැගෙනහිරට මෙම ඉඩමේ අංක 2 දරණ කොටස සහ ගම්සභා පාර ද, දකුණට දෙන් අන්ද්‍රිස් සමරසිංහ රෙජිස්ත්‍රාර්ට අයිති ඉඩම ද, බස්නාහිරට පාලම්මුල්ලේ ඔිවිටෙ දකුණු පැත්තේ කැබැල්ල, ගොන් කොටුව හා මහඹිවිට ද මායිම් වූ රූඩ් දෙකකුත් පර්චස් පහලොවයි හැටහතරෙන් පංගු පනස් නවය (අ. 0 රූ. 2 ප. 15 59/64) ක් විශාල ඉඩම හා ඊට අයිති බඩ් රබර් වගාව ඇතුලු ගහකොල, පලතුරු ආදී සියළු දේ.

(ලිපි ගොනු අංකය : ඩීආර්/15.)

15. බලපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී. 9/16 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයට අයත් බෙන්තොට වල්ලාවිට කෝරළේ, ඉදුරුගමට අයිති ගෝනගල පිහිටි, මැදගල්ගොඩ කැලේ හෙවත් කළුගලබැද්ද නැමති ඉඩමෙන් බෙද වෙන් කරන් ලද, ලොට් 1 දරණ කැබෙල්ල වූ, උතුරෙන් මෙම ඉඩමේ ලොට් 2 දරන කැබෙල්ල ද, නැගෙනහිරින් ' හයි ලැන්ඩ් ' යයි නඩුවේ පෙනෙන ගොඩ ඉඩම ද, දකුණෙන් අඩි පාර ද, බස්නාහිරෙන් මහපාරට තුඩු දී තිබෙන අඩිපාර ද යන මායිම් තුළ 1949 ඔක්තෝබර් මස 2 වැනි දින දින ඊ. ද. ඉසෙඩ්. ගුණවර්ධන බලයලත් මිනින්දෝරුතැන විසින් සාදන ලද අංක 2213 දරණ මිනුම් සැලැස්මේ ප්‍රකාර අක්කර එකකුත් පර්චස් දහසයක් (අ. 1 රූ. 0 ප. 16) විශාල ඉඩම් කැබැල්ලේ මුළු වසන් බිම සහ ගහකොල, පලතුරු ආදී ඊට අයිති සියල්ලත් වේ.

(ලිපි ගොනු අංකය : ඩී.ආර්/26.)

16. මඩකලපුවේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී. 235/229 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනායි පත්තුවේ, නොච්චිමුනායි හි පිහිටි දැනට මුරු ගප්පාර් වාලවු නැමති උතුරට කේ. යූ. නාගරත්නම්ගේ වත්ත දැනට ඕවසියර් එලියතම්බි කන්දයියාට අයිති ඉඩම ද, දකුණට කාන්තාපෙරුමාල්ට හා අනිකුත් අයට අයිති වත්ත දැනට පරිගාර් කන්දප්පාර්ට අයිති ඉඩම ද, නැගෙනහිරට මඩකලපුවේ සිට කල්මුනේට යන පාර ද, බස්නාහිරට සීනිතම්බි හා බිරිඳට අයිති වත්ත ද, දැනට තම්බිපිල්ලේ සින්නතම්බි සහ බිරිඳ සින්නතම්බි නාගරත්නම්ට දැවැද්දට දුන් ඉඩම ද යන මෙකී මායිම් තුළ පිහිටි උතුරේ සිට දකුණට බඹ දහයක් (බ. 10) ද, නැගෙනහිර සිට බස්නාහිරට බඹ විසිඑකක් (බ. 21) ද යන ප්‍රමාණයෙන් යුත්, ඉඩම් කැබැල්ල හා එහි පිහිටි ගහකොල, වැටිලි, ගොඩනැගිලි ඇතුලු සියලු දේත් සමග.

ඉහත කී ඉඩම දැනට පර්චස් විසි හයක් (අ.0 රූ.0 ප.26) ක් යැයි අවසර ලත් මිනින්දෝරු එන්. ෂන්මුගම් මහතා විසින් 1964. 4. 22 දින සාදන ලද අංක 19/1964 දරණ මිනුම් සැලැස්මේ පෙන්වා දී ඇත.

(ලිපි ගොනු අංකය : ඩීආර්/34.)

17. යාපනය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී. 56/243 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, පච්චිලයිප්පල්ලායි කොට්ඨාශයේ, පුලෝපල්ලායි මීසමේ, සොරන්පත්තු ගමේ පිහිටි කායිවයික්කලඩි සහ ඉලුප්පයියඩි නැමති නැගෙනහිරට ගම්සභා පටුමග ද, උතුරට සින්නප්පු සින්නයියා සහ කොටස්කරුවන්ගේ ඉඩම දැනට චින්නයියා වෙනයාගම්ගේ උරුමක්කාරයින්ට සහ අනිකුත් අයට අයිති ඉඩම ද, බස්නාහිරට මරුතෙන්කෙන්නිපල්ලායි පාර ද, දකුණට වැලි පාර දැනට ගම්සභා පටුමග යන මෙකී මායිම් තුළ වී. සී. ලාවම්ස් එකසිය තිස් එකක් සහ කුලීස් දෙකයි කාලක (වී. සී. ලා. 131 කු. 2¼) ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ල සහ එහි පිහිටි පොල් ගස් සහ ඊට අදල අනිකුත් සියලු දේ සමග.

ඉහත කී ඉඩම එස්. සිවරාමලිංගම් අවසර ලත් මිනින්දෝරු මහතා විසින් 1969. 1. 1 දින සාදන ලද අංක 79 දරණ මිනුම් සැලැස්මේ අංක 1 දරණ බිම් කැබැල්ල වශයෙන් හා ප්‍රමාණයෙන් වී. සී. ලාවම්ස් එකසිය දහසයක් හා කුලීස් එකොලහක් (වී. සී. ලා. 116 කු. 11) යයි පෙන්නුම් කර ඇත.

(ලිපි ගොනු අංකය : ඩීආර්/74.)

18. (අ) කෑගල්ල දිස්ත්‍රික්කයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී. 314/1 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බඩ කෝරළේ, ගල්බඩ පත්තුවේ, කඩිගමුවේ පිහිටි සියඹලාකුඹුර වි දෙපැලක වපසරියට මායිම් : උතුරට කැබැල්ල වත්තේ පැලඹුනි වැට ද, නැගෙනහිරට පිරිස් අප්පුට අයිති වලව්වේ හේනේ ඉවුර ද, දකුණට කිරිබණ්ඩාට අයිති සියඹලාකුඹුරේ ඉම නියර ද, බස්නාහිරට වලව්වට අයිති දෙහිගහමුල හේනේ පැල ඉනිවැට ද, මෙහි තුළ කුඹුරෙන් නොබෙදූ අටෙන් එක පංගුව (1/8).

ඉහත කී අටෙන් එක් පංගුව (1/8) 1962 මාර්තු මස 27 වෙනි දින ආර්. ජයතිලක බලයලත් මිනින්දෝරුතැන විසින් සාදන ලද අංක 2794ඒ දරණ පිඹුරේ පර්චස් විසි අටයි දශම එකයි දෙකයි පහ (අ. 0 රූ. 0 ප. 28.125) ක ප්‍රමාණයෙන් යුත් අංක '3' දරණ බිම් කට්ටිය යනුවෙන් පෙන්නුම් කර ඇත.

(ආ) කෑගල්ල දිස්ත්‍රික්කයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී. 305/300 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බඩ කෝරළේ, ගල්බඩ පත්තුවේ, කඩිගමුවේ පිහිටි කැබෙල්ල වත්ත අක්කර දෙකක් (අ. 2 රූ. 0. ප. 0) විශාලත්වයට මායිම් : උතුරට පුංචිරාලට අයිති කැබෙල්ල වත්තේ ඉම අගල සහ එඩරු වැට ද, නැගෙනහිරට ජුලිස් අප්පුට අයිතිකැබෙල්ල වත්තේ හේනේ අගල ද, දකුණට පුංචි මැණිකාට අයිති සියඹලාකුඹුරේ ඉම ද, බස්නාහිරට උක්කු අම්මාට අයිති අල්ලිස්ගේ හේනේ ගල් වැට ද, වලව්වට අයිති දෙහිගහමුල හේනේ ඉම සහ බණ්ඩාට අයිති කැබෙල්ල වත්තේ හේනේ ගල් වැට ද මෙහි තුළ ඉඩමෙන් නොබෙදූ හයෙන් එක පංගුව (1/6) යන මෙකී දේපල සහ ඒවාට අයිති ගහකොළ පලතුරු ආදී සියලු දේත් වේ.

ඉහත කී හයෙන් එක පංගුව (1/6) අංක 2794 ඒ දරණ පිඹුරේ පර්චස් තිස් දෙකක (අ. 0 රූ. 0 ප. 32) ප්‍රමාණයෙන් යුත් අංක 7 දරණ බිම් කට්ටිය යනුවෙන් දැන් පෙන්නුම් කර ඇත.

(ලිපි ගොනු අංකය : ඩීආර්/88.)

19. කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී. 348/167 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති, බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, තලන්ගම පිහිටි ඇටඹගහවත්ත නැමති උතුරට මහ පාර ද, නැගෙනහිරට කැටගොඩගේ කරනිස් අප්පු විසින් විකුණා තිබෙන කොස්හේනේවත්ත ද, දකුණට තන්ත්‍රිගේ ජෝ පීරිස් පෙරේරාට සහ තවත් කෙනෙකුට අයිති කොල්ලු කනත්තේ වත්ත ද, බස්නාහිරට වෙල ද මායිම් වූ වී බුසල් දොලොහක් පමණ වපසරිය විශාල ඉඩමේ (එකී ඇටඹගහවත්ත නම් ඉඩමේ) බස්නාහිර මායිම සහ උතුරු මායිමටත් යාව උතුරු දෙසින් යාර විසි හතරක් ද, නැගෙන හිර දෙසින් යාර විසි පහක් ද, දකුණු දෙසින් යාර විසි හතක් ද, බස්නාහිර දෙසින් යාර දහහතරක් ද, විශාල නොබෙදූ බිම් වාසියේ ගහකොළ, පලතුරු සමග බිම හා එහි තිබෙන අතු සෙවිලි ගෙය ද වේ.

ඉහත කී නොබෙදූ කොටස 1968 මැයි මස 31 වැනි දින සී. සී. වික්‍රමසිංහ බලයලත් මිනින්දෝරුතැන විසින් සාදන ලද අංක 734 දරණ පිඹුරේ පර්චස් දහසයක (අ. 0 රූ. 0 ප. 16) ප්‍රමාණයෙන් යුත් බිම් කොටස වශයෙන් දැනට පෙන්වා දී ඇත.

(ලිපි ගොනු අංකය : ඩීආර්/139.)

20. කොළඹ දිස්ත්‍රික්කයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ. 455/189 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සීමාවන් තුළ ශ්‍රී සංඝරාජ මාවතේ පිහිටි උතුරට දැනට ලොක්ගේට් පටුමගේ වරිපනම් අංක ජී 24 දරණ දේපලෙන් ද, නැගෙනහිරට දැනට ලොක්ගේට් පටුමගේ වරිපනම් අංක ජී 24 දරණ දේපලෙන් සහ දකුණු ස්කිනර්ස් පාරට දැනට ශ්‍රී සංඝරාජ මාවතට අයත් වරිපනම් අංක 9 න් ද, දකුණට දකුණු ස්කිනර්ස් පාරෙන් ද (දැනට ශ්‍රී සංඝරාජ මාවතෙන්ද), බස්නාහිරට දකුණු ස්කිනර්ස් පාරට අයත් (දැනට ශ්‍රී සංඝරාජ මාවතට අයත්) වරිපනම් අංක ජී. 3 දරණ ඉඩමෙන් ද මායිම් වූ 1954 පෙබරවාරි මස 18 වෙනි දින එස්. ඩී. නවරත්නම් මිනින්දෝරුතැන විසින් සාදන ලද අංක 256 දරණ පිඹුර ප්‍රකාර පර්චස් අටයි දශම දෙකයි හතක (අ. 0–රූ. 0–ප. 8.27) ප්‍රමාණයෙන් යුත් දෙල්ගහවත්ත නමැති බිම් කට්ටිය සහ එහි පිහිටි ශ්‍රී සංඝරාජ මාවතට අයත් වරිපනම් අංක 7 සහ 7/1 දරණ ගොඩනැගිලිත් සමග.

(ලිපි ගොනු අංකය : ඩීආර්/178.)

21. කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 862/62 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ දැනට කෝට්ටේ නගර සභා සීමාවන් තුළ ගංගොඩවිල පිහිටි උතුරට එල්. හේරත් පෙරේරාට අයිති මෙම ඉඩමේ කොටසකින් ද, නැගෙනහිරට හයිලෙවල් පාරෙන් ද, දකුණට මෙහි පහත සඳහන් කරන පිඹුරේ 'බී' අක්ෂරය දරණ මෙම ඉඩමේ කොටසකින් ද, බස්නාහිරට දෙවට පාරෙන් ද, මායිම් වූ 1948 දෙසැම්බර් මස 21 වැනි දින සී. ආර්. හාඩින් බලයලත් මිනින්දෝරුතැන විසින් සාදන ලද අංක 657 දරණ පිඹුරේ පෙන්වා ඇති ගොරකගහවත්ත නමැති ඉඩමේ පර්චස් දහයයි දශම පහක (අ. 0 රූ. 0 ප. 10.5) ප්‍රමාණයෙන් යුත් 'ඒ' අක්ෂරය දරණ කට්ටිය සහ එහි පිහිටි හයිලෙවල් පාරට අයත් වරිපනම් අංක 240 දරණ ගොඩනැගිල්ල සහ එහි පිහිටි ගහකොල, පලතුරු ආදී සියල්ල වේ.

(ලිපි ගොනු අංකය : ඩීආර්/206.)

22. ගාලු දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී. 576/110 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, කතළුවේ පිහිටි ගොඩඅරඹෙවත්තට මායිම් : උතුරට දීගොඩවත්ත සහ කොළඹගේ මලපලාවත්ත ද, නැගෙනහිරට මෙම ඉඩමේ ම කොටසක් ද, දකුණට කෝන්ගහ කොරටුව සහ කළුගෙරුප්පේ වත්ත ද, බස්නාහිරට කෝදාගොඩවත්ත, වැලිකොරටුවේ වත්ත සහ කළුගෙරුප්පෙ වත්ත ද යන මෙහි තුළ අක්කර එකකුත් රූඩ් එකකුත් පර්චස් විසි තුනකුත් දශම හයක් (අ. 1 රූ. 1 ප. 23.6) විශාල ඉඩමේ දොන් අන්දිරිස් ජයවර්ධන මහත්මයා විසින් වවා ඇති දෙවෙනි වැවිල්ලේ ගහකොල, පලතුරු හා කනුගහ නමැති කොස් ගහ සම්පූර්ණයෙන් ද, බිමෙන් හා බිමට හිමි ගහ කොල, පලතුරුවලිනුත් නොබෙදූ තුනෙන් දෙපංගුව ද, එහි තුළ ගොඩනගා ඇති ගල්බැමි, සුදුහුණු හා උළු සෙවිලිකළ නවරියන් ගෙයද වේ.

අවසර ලත් මිනින්දෝරු ජෝන් ඒ. ද සිල්වා මහතා විසින් 1936. 3. 12 වැනි දින සාදන ලද අංක 20303 දරණ මිනුම් සැලැස්මට අනුව, ඉහත කී තුනෙන් දෙපංගුව දැනට 'සී' අක්ෂරය දරණ බිම් කට්ටිය යනුවෙන් පෙන්නුම් කර ඇත.

(ලිපි ගොනු අංකය : ටීඩීආර්/248.)

23. හලාවත දිස්ත්‍රික්කයේ ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ බී. 151/125 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති වයඹ පළාතේ, හලාවත දිස්ත්‍රික්කයේ, පිටිගල් කෝරලේ, ඕතර පළාතේ, ගෝනාවිල පිහිටි උතුරට ඇන්තනි නෝරිස් වෙදරාලට අයිති ඉඩමෙන් ද, නැගෙනහිරට මර්තේලිස් පෙරේරාට අයිති මෙම ඉඩමේ කොටස් දෙකකින් ද, දකුණට දොන් බෙනඩික් අප්පුහාමිට අයිති ඉඩමෙන් ද, බස්නාහිරට දෝන පොර්ලෙන්තිනාහාමිට අයිති ඉඩමෙන් සහ කැලයට වෙන් වූ අක්කර තුනක (අ. 3 රූ. 0 ප. 0) පමණ ප්‍රමාණය ඇති මෙම ඉඩමේ කොටසින් ද මායිම් වූ අංක වෙ. 259 දරණ ඉඩමේ දකුණු මායිම දිගට අඩි හතක් (අ. 7) පමණ පලළට සහ අඩි හැත්තෑ පහක් (අ. 75) පමණ දිගට ඇති බිම් ප්‍රමාණය අත්හැර අක්කරයක් (අ. 1 රූ. 0 ප. 0) පමණ ප්‍රමාණය ඇති බිමෙන් නොබෙදූ හතරෙන් පංගුව (1/4) ක. මෙම නොබෙදූ හතරෙන් පංගුව (1/4) ඒ. සී. එස්. ගුණරත්න බලයලත් මිනින්දෝරුතැන විසින් සාදන ලද 1967. 7. 13 වෙනි දින අංක 3546 දරණ පිඹුරේ රූඩ් එකයි පර්චස් හතරක (අ. 0 රූ. 1 ප. 4) ප්‍රමාණයෙන් යුත් 'ඒ' අක්ෂරය දරණ කට්ටිය යනුවෙන් පෙන්වා ඇත.

(ලිපි ගොනු අංකය : ටීඩීආර්/33.)

24. මාතර දිස්ත්‍රික්කයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ. 252/76 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර තුළ සහ මාතර නගර සභා සීමාවන් තුළ කොටුවේගොඩ පිහිටි වරිපනම් අංක 561 (නව අංක 47) දරණ උතුරට මැද වීදියෙන් ද, නැගෙනහිරට මහවලව්වේ වත්තෙන්, බබානිසාගේ වත්තෙන් සහ බොයිතර් නෝනාගේ වත්තෙන් ද, දකුණට මෙම ඉඩමේ අංක 2 දරණ කට්ටියෙන් ද, බස්නාහිරට මෙම ඉඩමේ අංක 3 දරණ කට්ටියෙන් ද මායිම් වූ පර්චස් තිස් දෙකයි දශම තුනයි දෙකක (අ. 0 රූ. 0 ප. 32.32) ප්‍රමාණයෙන් යුත් කෝරළේ අරඹේ නැමති ඉඩමේ අංක 1 දරණ බෙදා වෙන් කළ බිම් කට්ටිය සහ එහි පිහිටි ගහකොල ඇතුලු සියලු දේත් සමග.

ඉහත කී ඉඩම බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසූරිය මහතා විසින් 1967. 11. 24 වෙනි දින සාදන ලද අංක 1534 දරණ මිනුම් සැලැස්මේ පෙන්නුම් කර ඇත.

(ලිපි ගොනු අංකය : ටීඩීආර්/351.)

25. මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඩී. 585/280 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කරන ලද දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, මුදුගමුවේ පිහිටි උතුරට ඩබ්ලිව්. අප්පු අයිතිවාසිකම් කී ඉඩම ද, උතුරු නැගෙනහිරට ඩබ්ලිව්. අප්පු සහ ඩී. බාලප්පු අයිතිවාසිකම් කී ඉඩම් ද, නැගෙනහිරට බබී සහ තවත් අයට අයත් ඉඩම ද, දකුණට ගමගේ අප්පුරාල සහ තවත් අයට අයත් ඉඩම ද, දකුණු බස්නාහිරව සහ බස්නාහිරට එම්. එච්. කළුබබානිසාට අයත් ඉඩම ද මායිම් වූ අංක 129076 දරණ සැලැස්මට අනුව අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් දහසයක (අ. 1 රූ. 2 ප. 16) ප්‍රමාණයෙන් යුත් වැඉර කුඹුර නැමති ඉඩම ය.

දැනට එකී ඉඩම අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් නවයකැයි (අ. 1 රූ. 2 ප. 9) අවසරලත් මිනින්දෝරු ඩී. එස්. රාජපක්ෂ විසින් 1968. 3. 27 වෙනි දින සාදන ලද අංක 3131 දරණ මිනුම් සැලැස්මෙහි පෙන්නුම් කර ඇත.

(ලිපි ගොනු අංකය : ටීඩීආර්/353.)

26. මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ. 257/4 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර තුළ වල්ගම පිහිටි උතුරට මෙම ඉඩමේ අංක 1 දරණ කට්ටියෙන් ද නැගෙනහිරට පාරෙන් ද, දකුණට වඩුගමගේ දනෝ පදිංචිව සිටි කහටගහවත්තෙන් ද, බස්නාහිරට කෝන්ගහවත්ත සහ සේනවීරගේ වත්තෙන් ද මායිම් වූ 1967. 2. 12 වැනි දින එම්. විමලසූරිය බලයලත් මිනින්දෝරුතැන විසින් සාදන ලද අංක 375 දරණ පිඹුර ප්‍රකාර රූඩ් එකයි පර්චස් තිස් නවයයි දශම දෙකයි පහක (අ. 0 රූ. 1 ප. 39.25) ප්‍රමාණයෙන් යුත් කහටගහවත්ත නමැති ඉඩමේ අංක 2 දරණ බෙදා වෙනස් කළ බිම් කට්ටිය සහ එහි පිහිටි ගහකොල ඇතුලු සියලු දේත් සමග.

(ලිපි ගොනු අංකය : ටීඩීආර්/355.)

27. කොළඹ දිස්ත්‍රික්කයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී. 516/307 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මුදලිතුමාගේ කොට්ඨාශයේ, අඹතලෙන් පහල ගොතටුවේ පිහිටි උතුරට කොළඹ–රත්නපුර මහා මාර්ගයෙන් ද, නැගෙනහිරට මෙම ඉඩමේ කොටසකින් ද, දකුණට මහ ඕවිටෙන් ද, බස්නාහිරට මෙම ඉඩමේ කොටසකින් ද මායිම් වූ 1943 දෙසැම්බර් මස 19 වෙනි දින එන්. සී. කුරේ බලයලත් මිනින්දෝරු මහතා විසින් සාදන ලද අංක 58/1943 දරණ පිඹුර ප්‍රකාර පර්චස් නවයයි දශම හතයි පහක (අ. 0 රූ. 0 ප. 9.75) ප්‍රමාණයෙන් යුත් වලඉරවැල්ල නොහොත් වලඉරවැල්ල ඕවිට නමැති ඉඩම සහ එහි පිහිටි ගහකොල, ගොඩනැගිලි ආදී සියලු දේත් සමග.

(ලිපි ගොනු අංකය : ටීඩීආර්/389.)

28. ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී. 58/363 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, ගහබඩ පත්තුවේ, වේරහැර පිහිටා ඇති ගලබඩවත්ත නැමති ඉඩමේ බෙදා වෙන් කළ එච් අක්ෂරය දරණ කොටස නමැති උතුරට ජී අක්ෂරය දරණ කොටස ද, නැගෙනහිරට ගම්සභා පාර සහ ගල ද, දකුණට අයි අක්ෂරය දරණ කොටස සහ ගලබඩ වත්ත ද, බස්නාහිරට ගල ද මායිම් වූ රූඩ් එකකුත් පර්චස් හතකුත් දශම අටයි බින්දුව (අ. 0 රූ. 1 ප. 7.80) විශාල ඉඩම සහ ඊට අයිති ගහකොල, පලතුරු ආදී සියලු දේත් සමග.

ඉහත කී ඉඩම ජේ. මලලාගම අවසරලත් මිනින්දෝරු මහතා විසින් 1954. 10. 26 වෙනි දින සාදන ලද අංක 1232 දරණ මිනුම් සැලැස්මේ පෙන්වා දී ඇත.

(ලිපි ගොනු අංකය : ටීඩීආර්/455.)

29. මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී. 188/89 දරණ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට, හේවාවිස්ස කෝරළේ, පට්ටියගම පිහිටි මැදකේකැලේ දෙනිය නමැති ඉඩමට ආර්. කනගරත්නම් මිනින්දෝරුතැනගේ අංක 372 සහ 1967. 7. 21 දින දරණ සැලැස්ම අනුව දැනට අංක 1 සහ 2 දරණ බිම් කැබලි වශයෙන් පෙන්වා දී ඇති උතුරට ගම්සභා පාර ද, නැගෙනහිරට ජුවානිස්අප්පුට අයිති දේපල ද, දකුණට මුහම්මදු තම්බිට අයිති දේපල ද, බස්නාහිරට දොමිනිගෝ අප්පුට අයිති දේපල ද යන මායිම් තුළ අක්කර හයයි රූඩ් එකයි පර්චස් විසි අටක් (අ. 6 රූ. 1 ප. 28) විශාල ඉඩම ද එහි ඇති වැවිලි ගොඩනැගිලි ආදී සියලු දැය ද වේ.

(ලිපි ගොනු අංකය : ටීඩීආර්/295.)

11—298

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි